# සරසවි තුළ වසර පහකට දේශපාලනය තහනම් කරන්නැයි මිලින්ද මොරගොඩ ජනාධිපති අපේක්ෂකයන්ගෙන් ඉල්ලයි



විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාකාරී දේශපාලන කටයුතු වසර පහකට තහනම් කිරීම කෙරෙහි ජනාධිපතිවරණ අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු බව පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ හිටපු කැබිනට් අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා යෝජනා කරයි. මෙරට සියලු විශ්ව විද්‍යාල අනාගත නායකයන් බිහිකරන වේදිකාවක් වශයෙන් ක්‍රියාකරන බව සත්‍යයක් නමුත් අවාසනාවකට මෙන් ප්‍රචණ්ඩ හා හිංසාකාරී තත්ත්වයක් පවතින අතර එය මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය විනාශ කර ඇති බව හෙතෙම පෙන්වා දෙයි. විශ්ව විද්‍යාල බුද්ධිමත් මණ්ඩප බවට පත් කරන තීරණයක් වශයෙන් ඉගෙන ගන්නා සිසු සිසුවියන්ගේ ක්‍රියාකාරී දේශපාලන කටයුතු විශ්ව විද්‍යාලය තුළ තාවකාලිකව තහනම් කිරීම සුදුසු අතර එය අපේක්ෂකයන් සිය ප්‍රතිපත්තිවලට ඇතුළත් කළ යුතු බව දක්වයි.

මෙම යෝජනාවට සමාන්තරව වයස අවුරුදු දහ අටට වැඩි පාසල් හැර යන සියලුම දෙනා අනිවාර්ය යුද සේවයට යොමු කිරීම සුදුසු බවට මෙයට කලින් දක්වන ලද අදහස හා එකතු විය හැකි බව ද හෙතෙම සියලුම ජනාධිපතිවරණ අපේක්ෂකයන්ට යෝජනා කර සිටී. ජාතිය, ආගම හෝ සමාජ තත්ත්වය වැනි කිසිම භේදයකින් තොර රටක් ගොඩනැඟීම අපගේ උදාර අරමුණ විය යුතුය. යුද, ගුවන්, නාවික හෝ පොලිස් සේවය කෙටි කාලයකට හෝ අනිවාර්ය කිරීම දැනට භේදභින්න වී සිටින ජන සමාජය එකතු කරන සංකල්පයක් වන අතර එමඟින් රට එක්සේසත් කළ හැකි බව ද මිලින්ද මොරගොඩ මහතා ප්‍රකාශ කරයි.